**මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන ව්‍යාපෘති - 01 - 2023**

---

මහ කොළඹ ජලය හා අප ජලය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - 01 ව්‍යාපෘතියේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2013 ජුනි 28 දින එළඹි අංක 2947-එස්.ආර්.අයි සහ අංක 2948- එස්.ආර්.අයි (එස්.එෆ්) දරණ ව්‍යාපෘති ගිවිසුමේ පරිච්ඡේද II හි 2.10(a) වගන්තිය සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියට අනුව සහ වැඩසටහන ව්‍යාපෘති 01 හි ණය ගිවිසුම්වලට අනුව, ව්‍යාපෘති 01 එවකට ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය වර්තමානයේ ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වැඩසටහන ව්‍යාපෘති 01 ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. වැඩසටහනේ ව්‍යාපෘති 01 හි අරමුණු වනුයේ, නාගරික පරිසරය වැඩිදියුණු කිරීම හා මහ කොළඹ ප්‍රදේශයේ නිවැසියන්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම සහ (අ) කොළඹ නගරයේ ජල සම්පාදන පද්ධතිය පුනරුත්ථාපනය කිරීම සහ පුළුල් කිරීම සහ ආදායම් නොලබන ජලය අඩු කිරීම (ආ) මහ කොළඹ ප්‍රදේශයේ අප ජලය සේවා වැඩිදියුණු කිරීම (ඇ) ආයතනික ව්‍යුහය ශක්තිමත් කිරීම සහ සේවා සපයන්නන්ගේ ධාරිතාවය වැඩිදියුණු කිරීම (ඈ) ආයෝජන වැඩසටහන කළමනාකරණය කිරීම හා ක්‍රියාත්මක කිරීම බලාපොරොත්තුවේ. ණය ගිවිසුම් අනුව, වැඩසටහනේ ව්‍යාපෘති 01 හි ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 14,784 කට සමාන එ.ජ.ඩො. මිලියන 112 ක් වන අතර ඉන් රු.මිලියන 11,088 කට සමාන එ.ජ.ඩො. මිලියන 84 ක් හෝ සියයට 75ක් මූල්‍යයනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 3,696 කට සමාන එ.ජ.ඩො. මිලියන 28 ක් හෝ සියයට 25ක් සඳහා ශ්‍රී ලංකා රජය විසින් දායක වීමට අපේක්ෂා කරයි. වැඩසටහන එහි කටයුතු 2013 සැප්තැම්බර් 25 දින ආරම්භ කරන ලද අතර, 2016 දෙසැම්බර් 31 වන විට නිමකිරීමට සැලසුම් කර තිබුණි. පසුව, වැඩසටහනේ කාලපරිච්ඡේදය 2021 ජුනි 30 දක්වා තෙවරක් දීර්ඝ කර තිබුණි.

## 1.3 තත්වාගනණය කල මතය

මෙම වාර්තාවේ 2.1 හි විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර 2023 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන හා මුදල් ප්‍රවාහයන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල ව සත්‍ය හා සාධාරණ තත්වයක් පිලිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

වැඩසටහනේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වේද යන්න පිළිබඳව සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීමක් උසස් මට්ටමේ සහතිකවීමක් නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව සිදු කරන විගණනයේදී සැමවිටම පවත්නා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් ලබා නොදේ. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් ප්‍රකාරව විගණනය කිරීමේදී කොටසක් ලෙස මාගේ විගණනය පුරාම වෘත්තීය විනිශ්චය ක්‍රියාත්මක කිරීම හා වෘත්තීය සැක මුසුව පවත්වා ගැනීම සිදු කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස වැඩ සටහනේ ව්‍යාපෘති 01 හි අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල අදාලත්වය සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරණ අඩුපාඩු /විගණන නිරීක්ෂණය | මුදල රු. මිලියන | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය **2022** මැයි **23** වැනි දින සැලකිය යුතු ලෙස අවසන් කර තිබුණද, ණය ගැනීමේ පිරිවැය රුපියල් මිලියන **231.73**ක් එන්ඩබ්එස්ඩීබී හි ලාභ අලාභ ගිණුමට අය කිරීම වෙනුවට කෙරීගෙන යන | **231.73** | සාමාන්‍යයෙන්, ව්‍යාපෘතියේ සෑම කොටසකටම ණය පොලී අය කෙරේ. පළමු වන කොටස දැනටමත් අවසන්වී ඇති බැවින්, **2024/04/24** දිනැති ලිපියක් මගින් **2023** වර්ෂයේ පොලිය අය | දෝෂය නිවැරදි කිරීමට සහ අනාගතයේදී නිවැරදි ගිණුම් ක්‍රියාපටිපාටිය අනුගමනය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | ප්‍රාග්ධන වැඩ ගිණුමට ප්‍රාග්ධනීකරණය කර තිබුණි. ඒ අනුව, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක **23 (23)** ට අනුකූලව අපේක්ෂිත භාවිතයට පැමිණෙන විට ණය ගැනීමේ පිරිවැය ප්‍රාග්ධනීකරණය අත්හිටුවීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි. | | නොකරන ලෙස ව්‍යාපෘතිය මණ්ඩලයට දන්වා තිබුණි. | |
| (ආ) | **2014, 2016** සහ **2017** වර්ෂවලදී රුපියල් මිලියන **133** ක් වටිනා වාහන ව්‍යාපෘතිය මඟින් මිලදී ගෙන මණ්ඩලයට භාර දී තිබුණි. නමුත් එම වාහනවල වටිනාකම ලෙජරයට රැගෙන ගොස් තිබුණේ රුපියල් මිලියන 112 ක් වශයෙනි. ඒ අනුව එන්ඩබ්එස්ඩීබී වෙත භාරදුන් වාහනවල ගිණුම් ශේෂය රුපියල් මිලියන **21** කින් අඩුවෙන් සටහන් කර ඇති අතර වාර්තා නොකළ වාහන හඳුනාගැනීමට කිසිදු විස්තරයක් නොවීය. | **21.30** | ව්‍යාපෘතිය සඳහා රුපියල් **133,217,966** ක් වටිනා වාහන ලබාගෙන ඇති අතර රුපියල් **111,909,396** ක් වටිනා වාහන ප්‍රධාන කාර්යාලයට මාරු කර තිබුණි. ඉතිරි රුපියල් මිලියන **21.308** වටිනා වාහන **2024** ගිණුම් වර්ෂයේදී දී මාරු කරනු ලැබේ. | දෝෂය නිවැරදි කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) | ව්‍යාපෘතිය යටතේ මිලදී ගත් කෘ කැබ් රථ **14**ක් සහ ඩබල් කැබ් රථ **07**ක් මණ්ඩලය වෙත පවරා තිබුණි. නමුත් මණ්ඩලයේ වත්කම් ලේඛනවලට අනුව ලැබී තිබුණේ වාහන **16**ක් පමණි. එබැවින් රුපියල් මිලියන **28**ක් වටිනා වාහන **5**ක් පිළිබඳව විගණනයට සාක්ෂි සැපයීමට ව්‍යාපෘති කළමනාකාරීත්වය අසමත් විය. | **28.46** | ඉතිරි වාහන වල **(5)** විස්තර වහාම සපයනු ලැබේ. | වාර්තා නොකළ වාහන පහකට අදාළ ප්‍රමාණවත් තොරතුරු ලබාදීමට වහා පියවර ගත යුතුය. |
| (ඈ) | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට මාරු කළ රුපියල් මිලියන **9**ක් වූ වාහන වටිනාකම වාහන ගිණුමට වාර්තා කිරීම වෙනුවට ද්‍රව්‍ය හුවමාරු ගිණුමට ගෙනවිත් තිබුණි. | **8.98** | එය සබරගමුව ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානයේ සිට එන්ඩබ්එස්ඩීබී වෙත මාරු කරනු ලැබේ අවශ්‍ය නිවැරදි කිරීම වහාම සිදු කෙරේ. | දෝෂය නිවැරදි කිරීම සඳහා පියවර ගත යුතුය. |
| (ඉ) | රුපියල් මිලියන **9** ක සමුච්චිත ලැබිය යුතු වැට් බදු මුදලක්, ජ'නල් වවුචර, වැට් ඉන්වොයිසි වැනි කිසිදු ලේඛනමය සාක්ෂියක් නොමැතිව මණ්ඩලයෙන් අරමුදල් ලැබීම් ගිණුමෙන් කපා හැර තිබුණි. | **9.2** | එකඟයි. පුනරාවර්තන පිරිවැය යටතේ වැට් බදු වියදම් ලෙස වාර්තා කිරීමට අපි ජර්නල් වවුචර් නිවැරදි කරන්නෙමු. | දෝෂය නිවැරදි කිරීමට පියවර ගත යුතුය. |

### 2.2 නීති, රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීම

| අංකය | නීති රීති සහ රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම/ විගණන නිරීක්ෂණය | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | මුල්‍ය රෙගුලාසි අංක 502(2)සහ **1978** දෙසැම්බර් **19** දිනැති අංක **842** දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ව්‍යාපෘති කාර්යාලය විසින් ස්ථාවර වත්කම් ලේඛනය නඩත්තු කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනය පිළියෙල කරමින් පවතින අතර දැනට පවත්වාගෙන යනු ලැබේ | චක්‍රලේඛයෙන් දක්වා ඇති උපදෙස් පරිදි වත්කම් ලේඛනය පවත්වාගෙන යා යුතුය |
| (ආ) | **2010** ජූලි **26** දින කළමනාකරණ චක්‍රලේඛ අංක **05,** | ව්‍යාපෘතියේ කටයුතු ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය විසින් විගණනය කර නොතිබුණි. | ඒ පිළිබඳ දැනුවත් වූ අතර අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා අභ්‍යන්තර විගණනයට දැනුම් දෙනු ලැබේ. | අභ්‍යන්තර විගණනයන් අඛණ්ඩව සිදුකිරීමට කටයුතු කළ යුතුය. |

### 3. භෞතික කාර්ය සාධනය

### 3.1 භෞතික ප්‍රගතිය

කොළඹ නගරයේ උතුරු සහ නැගෙනහිර කොටසේ පද්ධති පුනරුත්ථාපනය කිරීම හා ජල සැපයුම් පද්ධතිය පුළුල් කිරීම යටතේ කොළඹ නගරයේ ආදායම් නොලබන ජලය සියයට 49 සිට සියයට 18 දක්වා අඩු කිරීමේ අරමුණින් මීටර 469,200 ක නල ඇතිරීමේ කාර්යයන් සහ දිස්ත්‍රික් මිණුම් කලාප 36 ක නිවාස හිමියන් 62,932 කට සම්බන්ධතා මාරුකිරීමේ අරමුණින් ව්‍යාපෘතිය 1 ක්‍රියාත්මක කර තිබුණි. 2023 දෙසැම්බර් 31 දිනට වූ ප්‍රගති වාර්තාවට අනුව ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 100ක් වුවද, මෙම වාර්තාවේ 4.2 ඡේදයේ සඳහන් පරිදි ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණ ඉටු වී නොමැති බව නිරීක්ෂණය විය.

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| අංකය | ගිණුම්කරණ අඩුපාඩු /විගණන නිරීක්ෂණ | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොළඹ නගරයේ උතුරු සහ නැගෙනහිර ප්‍රදේශයේ ආදායම් නොලබන ජල ප්‍රතිශතය සියයට 49 සිට 18 දක්වා අඩුකිරීමේ ඉලක්කය සපුරා ගැනීමේ අරමුණින් ආදායම් නොවන ජලය කළමනාකරණ කටයුතු ක්‍රියාත්මක කිරීමට සහ ඉලක්කගත අරමුණු වල ප්‍රගතිය මැනීමට ප්‍රවාහ මිනුම් දත්ත ලබා ගැනීම සඳහා ඇමරිකානු ඩොලර් 383,710.2 ක වටිනාකමකින් යුත් (ආසන්න වශයෙන් රු.මි.115 ක් පමණ) ඩීඑම්ඡ් මීටර් 36 ක් සවි කර තිබුණි. කෙසේ වෙතත්, නිෂ්ක්‍රීය වූ බැටරි සහ දෝෂ සහිත ඩේටා ලොගර් හේතුවෙන් ඉහත ඩීඑම්ඡ් මීටර 36 න් මීටර 31 ක් අක්‍රියව පැවතුනි. තවද ඇතැම් මීටර 2022 වසරේ සිට අක්‍රියව පවතින බවද නිරීක්ෂණය විය. | ව්‍යාපෘතිය ප්‍රවාහ මීටර නිෂ්පාදකයාගෙන් අලෙවියෙන් පසු සේවාව ලබා ගැනීමේ ක්‍රියාවලියේ නිරතව සිටී. අවශ්‍ය බැටරි ආනයනය කර ප්‍රතිස්ථාපනය සඳහා කටයුතු කරමින් පවතී. තවද එන්ඩබ්එස්ඩීබී කොළඹ නගරය සඳහා ස්ථාපනය කර ඇති ප්‍රවාහ මිනුම් පද්ධතිය වරින් වර නඩත්තු කිරීම සඳහා දේශීය නියෝජිතයෙකු සමඟ නඩත්තු ගිවිසුමක් අත්සන් කරයි. | කළමනාකරණය මෙම සංරචකයේ අසාර්ථකත්වයට වගකිව යුතු අතර පවතින ගැටළු නිවැරදි කිරීමට සහ අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. |
| (ආ) | එම ඩීඑම්ඡ් මීටර වසර 3ක නිෂ්පාදන වගකීමක් සහිතව 2016 සහ 2017 වසර වලදී මිලදී ගෙන තිබුණු අතර මිලදී ගත් දින සිට වසර දෙකකට පසු ඒවා සවි කර තිබුණි. තවද ස්ථාපනය කරන විටත් මීටර 36න් | ප්‍රවාහ මීටර් වල ගැලපීම සහතික කිරීම සඳහා එම මීටර තනි වෙළඳ නාමයකින් මිලදී ගන්නා ලදී. මුල් ව්‍යාපෘති සැලැස්මට අනුව එය | නියමිත කාල රාමුව තුළ දී ඇති කාර්යය සම්පූර්ණ කිරීමට ව්‍යාපෘති කළමනාකාරිත්වය වගකිව |

| | | | |
|---|---|---|---|
| | 31ක වගකීම් කාලය අවසන් වී තිබූ බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, ව්‍යාපෘති කළමනාකාරීත්වය තවමත් එම දෝෂ සහිත මීටර නිවැරදි කිරීමටත්, එම මීටර් නඩත්තු කිරීමට නිෂ්පාදක බලයලත් දේශීය නියෝජිතයෙකු සමඟ ගිවිසුමකට එළැඹීමටත්, ප්‍රවාහ මීටර සවිකිරීමේ ක්‍රියාවලිය බරපතල ලෙස ප්‍රමාද වීම නිසා සැපයුම්කරුගේ වගකීම් කාලය දීර්ඝ කිරීමටත් තවමත් කටයුතු කර නොතිබුණි. | 2018 වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.. කෙසේ වෙතත්, නල එලීමේදී ප්‍රධාන කොන්ත්‍රාත්කරු මුහුණ දුන් වැඩබිමේ විවිධ දුෂ්කරතා හේතුවෙන්, ඩීඑම්ජ් සැකසීමට අපේක්ෂිත කාලයට වඩා වැඩි කාලයක් ගත විය. එබැවින් ස්ථාපන කටයුතු ප්‍රමාද විය. | යුතුය. |

3.3 **පෙර විගණන වාර්තා මගින් පෙන්වා දුන් විසඳී නොමැති කරුණු**

| **අංකය** | **ගිණුම්කරණ අඩුපාඩු /විගණන නිරීක්ෂණ** | **කළමණාකරණයේ අදහස් දැක්වීම** | **විගණකගේ නිර්දේශය** |
|---|---|---|---|
| **(අ)** | රත්මලාන ප්‍රධාන ගබඩා පරිශ්‍රයේ ජල මීටර පරීක්ෂා කිරීමේ වැඩපොලක් ඉදිකිරීම සඳහා **2014** වර්ෂයේදී රුපියල් මිලියන **2** ක අත්තිකාරම් ගෙවීමක් සහිතව පුද්ගලික කොන්ත්‍රාත්කරුවෙකුට රුපියල් මිලියන **11** ක කොන්ත්‍රාත්තුවක් ලබා දී තිබුණි. **2024** අප්‍රේල් මාසය වන විට කොන්ත්‍රාත්තුව ලබා දී වසර **10** ක් ගතවී තිබුණද කොන්ත්‍රාත්කරු ඊට අදාළ කිසිදු කාර්යයක් කර නොතිබුණු අතර කළමනාකාරීත්වය විසින් අත්තිකාරම් ගෙවීමේ ඇපකරයේ කාලය දීර්ඝ කිරීමට හෝ එම ඇපකර, මුදල් කිරීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි. | එන්ඩබ්එස්ඩිබී විසින් අදාළ පාර්ශවයට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කර තිබුණි. | මූල්‍ය පාඩු කොන්ත්‍රාත්කරුගෙන් හෝ වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.4 පද්ධති සහ පාලන**

| **අංකය** | **ගිණුම්කරණ අඩුපාඩු /විගණන නිරීක්ෂණ** | **කළමණාකරණයේ අදහස් දැක්වීම** | **විගණකගේ නිර්දේශය** |
|---|---|---|---|
| **(අ)** | ව්‍යාපෘතිය භෞතික වශයෙන් වසර දෙකකට පෙර අවසන් කර සහ කොන්ත්‍රාත්තුවේ අවසන් බිල්පත් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා තිබුණද රුපියල් මිලියන **16,452**ක වටිනාකමින් යුත් ස්ථාවර වත්කම්වලට අදාළ, වත්කම් ප්‍රාග්ධනීකරණ කටයුතු අවසන් කර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත විධිමත් ලෙස භාරදී නොතිබුණි. | පැකේජ් **1** සහ **2** අවසාන බිල්පත් සම්පූර්ණ කර ඇති බැවින්, මෙම මුළු මුදල වත්කම් පෝරම හරහා ප්‍රාග්ධනීකරණයට එකතු වේ. | වත්කම් ප්‍රාග්ධනීකරණ ක්‍රියාවලිය වේගවත් කිරීමට සහ තවදුරටත් ප්‍රමාදයකින් තොරව ව්‍යාපෘතිය අවසන් කිරීමට වහාම පියවර ගත යුතුය. |
| **(ආ)** | නළ එළන ලද සියලුම මාර්ග කොළඹ මහ නගර සභාවට පවරා දෙවසරක් ගතවී ඇතත් ව්‍යාපෘතිය මගින් සිදු කරන ලද ඉදිකිරීම් සම්බන්ධයෙන් වූ රුපියල් මිලියන **109**ක ආරක්ෂක තැන්පතු මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පවරා දී ඇති මාර්ගවල ආරක්ෂක තැන්පතු නිදහස් කරන ලෙස දැනටමත් කොළඹ මහ නගර සභාවෙන් ඉල්ලා තිබුණි. | තවදුරටත් ප්‍රමාදයකින් තොරව ඇප මුදල් අයකර ගැනීමට වහා පියවර ගත යුතුය |